19/12/2010 - ඉරිදා ලංකාදීප

**සමාජ ඉදිරිගමනට වැදගත් පොදුඅරමුණ ද - පටු අවශ්‍යතාවය ද ? - මිලින්ද මොරගොඩ**

අන්ධකාර යුගයක් පසු කළ ශ්‍රී ලංකාව අභියෝගාත්මක යුගයකට අවතීර්ණ වී සිටී. අප ගතකරමින් සිටි යුධ කාල පරිච්ඡේදය අන්ධකාරයයි. දශක තුනක පමණ කාලයක් ඇතුලත ලාංකේය සමාජය යුද බිය හා එහි පීඩාවෙන් මහත් හිරිහැර වින්දේය. ජීවිත අහිමිවිය. දේපොළ විනාශ විය. මේ සියල්ලට වඩා සමාජ එකමුතුකම, ජාතීන් අතර සමගිය දෙදරා ගියේය. අන්ධකාරයට පසු වැටෙන අරුණාලෝකය දෙස අප බලා සිටින්නේ මහත් බලාපොරොත්තු ඇතිවය.

මෙම බලාපොරොත්තු විසින් අනාගත සමෘද්ධිය ඇතිකරනු ඇත. ඒ සමෘද්ධිය උදෙසා කැපවීම හා නිසි දැක්මක් ඇතිව ක්‍රියාත්මකවීම වැදගත්ය. අලුත් ආකල්ප අලුත් අවකාශයන් සොයායාම එහිලා අනිවාර්ය සාධකයක් වනු ඇත. අවුරුදු තිහක් පමණ පැවති එකම ආකාරයේ ගමන්මග වෙනස් කළ යුතුය. අලුත් දේ සොයා යාමකින් තොරව සමාජ පරිවර්තනයක් ඇති නොවේ. එකී පරිවර්තනයට සූදානම් විය යුතු අප සිතන හා ක්‍රියාකරන ආකාරයේ පටන්ය.

අප සමාජයේ හැසිරීම් රටාව දෙස අවධානයෙන් බලන්න. සිතන්නට පටන් ගන්න. රෝහලකින් බලාපොරොත්තු වන්නේ සුවය හා නිරෝගිබවයි. රෝගීන්ගේ අපේක්ෂා හා බලාපොරොත්තු වෙනුවට අද මුල්තැන ලැබී ඇත්තේ සෞඛ්‍ය සේවාව වෙනුවෙන් සිටින සේවකයන්, විශේෂඥයන් හා නිලධාරීන්ගේ බලාපොරොත්තු වලටය. යුතුකම අමතක කරන රෝගීන් වෙනුවෙන් පෙනී සිටින පිරිස එය තම අයිතිවාසිකමක් බවට පෙරළාගෙන ඇත. තමන් සතු බලය බවට පත් කරගෙන තිබේ.

අධ්‍යාපනය ලැබිය යුතු දරුවන් ගැන බලමු. ඉගෙන ගැනීම වෙනුවට අයිතිය දිනා ගැනීම වෙනුවෙන් සටන් බිමක් බිහිවී තිබේ. දරුවන්ගේ ඉගෙන ගැනීම් හෝ නව අධ්‍යාපන ප්‍රවණතා වෙනුවට අප සාකච්ඡා කරන්නේ ඉල්ලීම් ගැනය. නිදහසේ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය සමාජයට දෙන්නට ක්‍රමය විසින් ඉඩ දෙන්නේ නැත. දරුවන් ද ගුරුවරුන් ද අයිතිය ඉල්ලා බල කරමින් සිටිති. ඉගෙන ගන්නට වෑර වීරිය දරන සිසු සිසුවියන් වෙනුවෙන් පෙනී සිටින්නට කිසිවෙකු නැත. ඉගෙනුමට ඇති අවස්ථාව වෙනුවට ඉගෙන ගන්නා තැන තමන්ට හිමි බලය තහවුරු කර ගැනීමේ සටනක් ඇරඹී ඇත. ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශය ද කාලයකට කලින් මෙවැනි ඉරණමකට මුහුණ දුන්නේය. පෞද්ගලික අධ්‍යාපන ආයතන තරඟකාරීව ඇති කරන්නට පලාත් ආණ්ඩුවට අවශ්‍ය වුවත් නිලධාරීන්ගෙන් එයට කැමැත්තක් දැක්වූයේ නැත. හිටපු මහ ඇමති චන්ද්‍රබාබු නයිදු මහතා සුළු පිරිසක් විසින් ක්‍රමයේ ආධිපත්‍ය දරමින් එය වෙනස් කිරීමට ඉඩ නොදෙන බව අවබෝධ කර ගත්තේය. ආයෝජන වලට ඉඩ දී මධ්‍යම රජයට අයත් හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාලඅතර තරඟකාරීත්වයක් ඇති කිරීමට එරෙහිවූ නිලධාරීන්ගෙන් ඔහු ප්‍රශ්න කළ විට එම නිලධාරීන්ගේ දරුවන් වැඩි දෙනෙක් විදේශගතව උසස් අධ්‍යාපනය ලබන බව අනාවරණය කර ගත හැකි විය. පවතින තත්ත්වය වෙනස් කිරීමෙන් තමන් ගේ නිලය හෝ බලය ආරක්ෂා කර ගැනීමේ පටු අරමුණ ගැන සිතා ක්‍රියා කිරීම යුක්ති සහගතද?

දේශපාලනය හා රාජ්‍ය සේවය අතර ද ඇත්තේ මේ පටු ආකල්පම ය. නිලධාරීන් හා මැති ඇමතිවරුන් තම බලය පෙන්වීමට මහජනතාව තමන් කරා පැමිණීම අපේක්ෂා කරයි. පහසුවෙන් ඉටු කළ හැකි දෙයක් වෙනුවෙන් තීරණයක් ගන්නේ නැත. නිලධාරීන් තම මහේශාඛ්‍ය බව පෙන්වන්නේ ජනතාවටය. මැති ඇමතිවරු ප්‍රතිපත්ති සම්පාදනයට හා අවශ්‍ය තීරණ ගැනීමට සීමා වී තම නිලධාරීන්ට වැඩ කරන්නට ඉඩ දිය යුතුය. ඒ සාමාන්‍ය ක්‍රමය වෙනුවට තමන්ගේ මැදිහත්වීම නැතිව කිසි දෙයක් නොවෙන බව පෙන්වන්නට යාම සුදුසුද? එපමණක් නොවේ. එම ක්‍රමය වෙනස්කර දේශපාලනයට අලුත් මුහුණුවරක් දෙන්නට ද අප සූදානම් නැත. මන්ද මේ පටු පැවැත්ම විසින් ක්‍රමය ආරක්ෂාකරන බැවිනි.

නීතිය කුමක්ද? නීතියේ පිහිට ලැබිය යුතු යුක්තිය හා සාධාරණත්වය අහිමිවූ සමාජයේ යම් කොටසකටය. එනමුත් යුක්තිය හා සාධාරණත්වය සමාජයේ තහවුරුවී තිබේද? නැත. තමන්ට

අහිමි වූ යුක්තිය ඉල්ලා නීතියේ පිහිට පතන්නට සාධාරණ අවස්ථා තිබේද? නීතියේ බලය හිමිව ඇත්තේ නීතිය වෙනුවෙන් පෙනී සිටින්නන්ට විනා නීතියේ බලය ලැබිය යුතු මහජනතාවට නොවේ.

ප්‍රජාතන්ත්‍රවාදී රටක බලය ඇත්තේ පොදු මහජනතාවටය. මහජනතාවගේ ශක්තිය, ඉහලම බලපෑම විය යුතුය. ඔවුන්ගේ හඬ නැගෙන ඉහළම හඬ බව අපට දැනෙන්නට අවශ්‍යය. බහුතර මහජනතාව නගන හඬ සුළු එකකි. සුළු සිරිසක් විසින් බහුතරයේ මතය යටපත් කර තිබේ.

නායකත්වය යනු කුමක්ද? නායකයින්ගේ ස්වභාවය කෙබඳුද? ජාතික, ආගමික හෝ රාජ්‍ය නායකත්වයෙන් අපේක්ෂා කරන පැවැත්ම කවරාකාරයේ එකක්ද?

මන්ද අධිරාජ්‍යවාදීන්ට යටත්ව සිටි කාලයේ ලංකාවට නායකත්වයේ බලපෑම ලැබුණේ යටත්විජිත පාලකයන්ගෙනි. අධිරාජ්‍යවාදී පාලකයන් විසින් සිය පාලිතයන් සම්බන්ධයෙන් තීන්දු ගත්හ. ඔවුන්ගේ නියෝග වලට අවනතව වැඩ කරනු විනා රටට අනන්‍ය නායකත්වයකට ඉඩක් නොතිබිණි. නිදහස ලැබීම සමග මේ ගමන් මග වෙනස් විය. මහජනතාව වෙනුවෙන් තමුන්ගේම නායකයන් තීන්දු ගන්නා, ඒ නායකයන්ගේ දර්ශනය හා ප්‍රතිපත්ති අනුව රට මෙහෙයවන යුගයක් උදා විය. එනමුත් නිදහස සමග ලංකාව පසුගිය දශක හය තුළ ඇදී ගියේ අනපේක්ෂිත දිසාවකටය. මහජනතාව තමන් සතු බලය දේශපාලන නායකයන්ට පැවරීය. එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකි.බලය ලබා ගත් දේශපාලන නායකයින් ක්‍රියා කළේ තම අභිමතය පරිදිය. මහජනතාව මත තම බලය හා ආධිපත්‍ය පතුරවනවා විනා බලය දුන් සමාජයේ උවමනාව දෙස අවධානය ප්‍රමාණවත් අන්දමට යොමු නොකළේය. බලය ලබා ගැනීමට මහජනතාවට සහනාධාර දුන්නේය. ඔවුන් යැපෙන්නන් බවට පත් කළේය. බලය ලබාගත් ආණ්ඩුව මහජනතාව ජීවත් කළ අතර තමන් ට ජීවත්වන්නට වැඩිපුර සහාය දෙන කණ්ඩායම සමග එකතු වන දේශපාලන අනුගාමිකයන් රට පුරා වර්ධනය විය. අනුගාමිකයන්, අතරමැදියන් නඩත්තු කරන දේශපාලන ක්‍රමයක් රට තුළ ඇතිවෙන්නට මුල පිරුණේ එහෙමය.

ස්වාධීන මතයක් දරන, අන්‍ය මතයට ගරු කරන නිවහල් පුද්ගලයන් නිදහස් රටක් තුළ මතුවිය යුතු අවස්ථාවක රට තුළ චරිත වශයෙන් ඉදිරියට පැමිණියේ බලය වෙනුවෙන් අතරමැදි අනුගාමිකයන්ය. නිදහසේ සිතන්නට, නිවහල් චින්තනයක් ගොඩ නගන්නට මේ නිසා ඉඩ ලැබුණේ නැත. සිවිල් සමාජයේ පොදු ජනතාව ගරුකරන නිදහස් මතධාරීන් බිහිවූයේ නැත. ප්‍රජාතන්ත්‍රවාදීව මහජන මතය මතු නොවෙන විට, මහජනතාවගේ අවශ්‍යතා ඉටු නොවෙන විට උණුසුම් ලේ ඇති තරුණන් මේ ක්‍රමයට එරෙහිව නැගී සිටිය බව අමතක කළ යුතු නැත. අදටත් දේශපාලන ක්‍රමය පවත්වාගෙන යන්නේ මේ විකල්ප මතය යටපත් කර එයින් නැගී සිටීමෙනි. දකුණේ දෙවතාවක් හා උතුරේ නැගී සිටි සන්නද්ධ අරගලයට යටින් නොකියවුණ යථාර්ථය අප හඳුනාගෙන තිබේද? මර්දනය හා යටපත් කිරීම තාවකාලිකය. උත්තරය ඇත්තේ බලය යළි මහජනතාව අතට දෙන ක්‍රමවේදයක් ගොඩනැගීමට හැකි නායකත්වයක් බිහිකිරීම තුළ පමණකි.

නායකත්වය කෙබඳු ද යන ප්‍රශ්නයට ඍජු පිළිතුරක් අපේක්ෂා කිරීම අසාධාරණය. විවිධ රටවල විවිධ යුග වල විවිධ සාමාජයික හා ආර්ථික අවශ්‍යතා වෙනුවෙන් නායකයන් බිහිව තිබේ. ඔවුන්ගේ පෞර්ෂයය එකිනෙකට වෙනස්ය. තීන්දු ගන්නා ස්වභාවයේ පරස්පරතා ඇත. ජනතාව ඇතැම්විට අවධානය නොදක්වන ඉලක්කයක් කරා සමාජය මෙහෙයවන්නටත්, වර්තමානය මෙන්ම අනාගතය දෙස බලමින් කැපවීමෙන් කටයුතු කරන්නටත් දූරදර්ශී නායකයන්ට හැකියාව තිබිය යුතුය. බලය තමන් අත නොව මහජනතාව අතට පත් කරන්නට ඔවුන් සමත්වීම වැදගත්ය. එය කළ හැකිවන්නේ මහජනතාවගේ පැත්තෙන් සිතන්නට හැකිනම් පමණකි. රෝහල ඇත්තේ රෝගියාටය. පාසල ඇත්තේ දරුවන්යට. අධිකරණය ඇත්තේ යුක්තිය අහිමිවූ සමාජයේ යම් කොටසකටය. ඉඩම හිමි විය යුතු ඉඩම ප්‍රයෝජනයට ගන්නා ගොවියාටය. වෙළඳපොළ හිමි විය යුත්තේ පාරිභෝගිකයාටය. මෙවැනි විකල්ප වැඩ

පිළිවෙලකට අප ගමන් කළ යුතුය. සමාජයට බලය ආපසු පිරිනැමෙන අවස්ථාවක් වෙනුවෙන් ක්‍රියා කළ යුතු යුගය උදා වී තිබේ. දියුණු සමාජ මහජනතාව යනු තව දුරටත් තමන් ළඟට පැමිණෙන කරදරකාරයෙකු සේ නොසිතයි. ඔහු පාරිභෝගිකයෙකි. පාරිභෝගිකයා තෘප්තිමත් කර වෙළඳාම දියුණු කර ගන්නා අන්දමට මහජනතාව ෂතුටු කර පාලනය ඉදිරියට ගෙනයාමේ කලාව ගැන අද ජාත්‍යන්තර දේශපාලන ප්‍රතිපත්ති වෙනස් වෙමින් තිබේ.

මෙම වෙනස ඇති කළ හැක්කේ කාහටද? බලය තමන්ට පමණක් කේන්ද්‍රවිය යුතුයැයි සිතන පුද්ගලයාටද? පුද්ගලයන් නැගී සිට සමාජය ගොඩ නැගෙන දෙස බලා සිටින්නට සමත් නායකයන්ටද? එක් පුද්ගලයෙකු බලවත් වීමට වඩා දරුවන්, කාන්තාවන් හා පුරුෂයන් වශයෙන් සමාජයේ සියලු කොටස් බලවත්වන විට සමාජය ගොඩනැගෙන බව සිතන්නට හැකි විශිෂ්ඨයන්ටද?

වර්තමානයේ ජගත් ප්‍රජාව නායකත්වය දකින්නේ කෙසේද? ප්‍රධාන වශයෙන් මෘදු soft Power නායකයන් සිටිති. ඔවුන්ට තම හැකියාව මත පෞර්ෂය අනුව තමුන්ගේ ගමන්මග හා දර්ශනය ජනතාවට ඒත්තු ගන්වන්නට සමත්ය. දෙවනුව දැඩි hard Power නායකයන් ද සිටිති. ඔවුන් දක්ෂ ලෙස රාජ්‍ය පාලනය කරන්නේ දඩුවම හෝ ප්‍රතිලාභ පෙන්වමින් සිට අනුගාමිකයන් තෘප්තිමත් කරමිනි.

නායකත්වයේ ගුණාංග දෙස තවත් විමසිලිමත්ව අධ්‍යයනය කරන විද්‍යාර්ථීන් Transactional Leaders හා Transformational Leaders යනුවෙන් ද, නායකයින් වර්ග කළ හැකි බවට හඳුනා ගනී.

මෙම Transformational ට්‍රාන්ස්පොමේෂනල් නායකයින් තම ක්‍රමය ජනතාවට පැහැදිලි කරදෙයි. ඔවුන්ගේ හදවත් වලට සිය අදහස් කාන්දු කරයි. එවිට පාලනය පහසුය. මෙවැනි ඕනෑම නායකයෙකු සතු දක්ෂතාවය හා සන්නිවේදන හැකියාව මත මහජනතාවට ඒත්තු ගන්වන පිළිවෙත නිසා මහජන විශ්වාසය පැතිරෙයි. ට්‍රාන්ස්ඇක්ෂනල් Transactional නායකයින් පවතින්නේ මෙවැනි ප්‍රතිපත්ති වලට හාත්පසින්ම වෙනස් අන්දමටය. එවැනි වර්ගයේ නායකයන් මහජනතාව දන්නා පරිදි ඩීල් මගින් සිය පාලන මෙහෙයවීම ඉදිරියට ගෙන යයි. මහජනතාව සිද්ධියේ පසුබිම හෝ කුමක් සිදුවී ද යන්න දන්නේ කාරණාව අවසන් වූ පසුවය. ඔවුන්ගේ පාලනය තමුන්ට ආවේනික පරිදි එකිනෙකට වෙනස් උපායයන්ය.

නිවසට ද නායකත්වය අවශ්‍යය. ගෘහ මූලිකයා තම පවුලේ සාමාජිකයන් රැක බලාගනී. ඔවුන්ගේ උවමනා එපාකම් සපුරාලයි. දුක සැප බෙදාගෙන පවුලේ දියුණුව සඳහා වගකීම් ඉටු කරයි. සමාජ නායකයන්, ආගමික හෝ කණ්ඩායම් නායකයන් ඉටු කරන්නේත් මේ වගකීමයි. එය එකිනෙකට වෙනස්ය. මේ නායකත්වය යනු බලය තමන් අතට පත් කර ගැනීම නොවේ. බලය ඇති පිරිස වැඩි කර ගන්නට හැකිවීමයි. අධිපතිවාදී නායකත්වයට වඩා ට්‍රාන්ස් ඇක්ෂනල් නායකයින් දෙස අද දියුණුවන ලෝකය බලා සිටින්නේ ඒ නිසාය. එනමුත් අධිපතිවාදී නායකයින් ද, ජනහිතකාමී අන්දමට ක්‍රියාකරන ලද අවස්ථා ලෝක ඉතිහාසයේ සඳහන්ය. දේශපාලනයේ දී ට්‍රාන්ස්පොමේෂනල් නායකත්වය පමණක් ම ප්‍රමාණවත් නැත. යම් ප්‍රමාණයකට ට්‍රාන්ස්ඇක්ෂනල් ගුණාංග ද මුහුවී තිබීම අවශ්‍යය.

නිදහසට පසු ගතවූ කාලයතුළ මෙරට මහජනතාව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට අනුව රාජ්‍ය නායකයන් තෝරා ගත්හ. දේශපාලන පක්ෂ සමාජ නායකයින්, ජනමත ප්‍රධානීන් හා විවිධ පාර්ශවයන් මේ රාජ්‍ය නායකයන් බලයට පත්වූ පසු බලය ආරක්ෂා කර ගැනීම සඳහා ඇති අවස්ථා ගැන උනන්දුවූහ. මැතිවරණ වලදී ප්‍රජාතන්ත්‍රවාදීව නායකයන් තෝරා ගැනීම කරන නමුත් මැතිවරණ අවසන් වී අවුරුද්දක් දෙකක් යන විට බොහෝ අවස්ථාවල මහජනතාව පශ්චත්තාපවන බව පොදු පිළිගැනීමයි. මැතිවරණ වේදිකාවේදී නායකත්ව ගුණාංග වෙනුවට දේශපාලන පොරොන්දු හා ප්‍රතිවාදීන් පරාජය කරන්නට ඉදිරිපත් කරන තර්ක නිසා බහුතර ඡන්ද දායකයන් අවසානයේදී පත්වන්නේ තීරණයක් ගත නොහැකි අවස්ථාවකටය. මැතිවරණයේදී නායකයාගේ ස්වභාවය හෝ ඔහු තීන්දු ගන්නා ආකාරය ගැන සිතන්නේ ඡන්ද දායකයන්ගේ සුලු පිරිසකි. සිය අනාගත නායකයාගේ දර්ශනය හා ඔහුගේ මෙහෙවර සෙසු

අපේක්ෂකයන්ගේ සමත්කම් සමග සසඳන්නට පෙළඹෙන්නේ තවත් සුලු කොටසක් පමණකි. බොහෝ අවස්ථාවල පක්ෂ දේශපාලනය නිසා අපේක්ෂකයා කවරෙකු වුවත් පක්ෂයේ ප්‍රතිපත්ති හෝ පාරම්පරික ලැදියාව හෝ ප්‍රචාරක උපක්‍රම නිසා හෝ මහජනතාව සිය තීන්දුව ගනී. නමුත් බලයට පත් වන නායකයින් පොරොන්දු ඉටු නොකිරීම හෝ අපේක්ෂිත කාර්යක්ෂමතාවය සහිත නායකත්ව ගුණාංග පෙන්නුම් කළ නොහැකිවීම නිසා ඉක්මනින්ම මධ්‍යස්ථ මහජනතාවගෙන් ඈත්වෙයි.

පටු ආකල්ප හා නියම තත්ත්වය වසංකරමින් හැසිරෙන්නට වර්තමානයේ දී පහසු නැත. දශක කිහිපයකට වඩා මාධ්‍ය භාවිතාව දියුණුය. තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තියක් තිබේ. මහජනතාවගේ අවධානය දිනා ගන්නා පුද්ගලයන්ගේ හොඳ නරක හා අභ්‍යන්තර හිසිරීම ගැන විවිධ තොරතුරු විවිධ පැතිවලින් වාර්තා වෙයි. අද වීරයෙකු වන පුද්ගලයෙකු ගේ චරිතයේ සුළු දුර්වලකමක් පෙන්වා ඔහු ගේ ප්‍රතිරූපය නැති කරන්නටත් මේ තොරතුරු හුවමාරුව වැඩි කාලයක් ගන්නේ නැත. ප්‍රතිරූප ඇතිවීම හා ඉක්මනින් නැතිවීම අද බහුල වී ඇත්තේ මේ මාධ්‍ය භාවිතාව පැතිරී ඇති හෙයිනි. මහජනතාව මෙන්ම නායකයින් ද මේ යථාර්ථය හඳුනාගෙන ස්වකීය පැවැත්ම තීරණය කිරීම මැනවි.

ශ්‍රී ලංකාව වැනි රටවල දේශපාලන නායකයකන්ට සිදුවන්නේ එයයි. බොහෝවිට වේදිකාවට නගින නායකයාගේ ස්වරූපය හා ඔහු හැසිරෙන ආකර්ශණීය බව ඉදිරියේ විනා නායකයන්ට ඇති හැකියාව හා ඔවුන්ගේ ගුණාංග තක්සේරු කිරීමට පුලුල් ඉඩක් නොලැබේ. එයින් සිදුවන්නේ හානියකි. ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග වර්ධනය කරනවා හා සමානව මහජනතාව තම නායකයාගේ හැකියාව හා ඔහුගේ ශක්තිය පිළිබඳව විශ්වාසයකින් යුතුව තීන්දු ගන්නා අවකාශය වැඩි දියුණු වීම අවශ්‍යතාවයයි.

ඕනෑම ක්ෂේත්‍රයක නායකයින් තමන් ගේ ශක්තිය පෙන්වා තම ස්වාර්ථය අනුව පමණක් යැපෙන සමාජයක් නොව ස්ව ශක්තියෙන් යැපෙන බලගතු නිර්මල සමාජයක් බිහි කරන්නට ඇති හැකියාව ගැන අවධානය යොමු කළ යුතුය. සුළු පිරිසකගේ ස්වාර්ථකාමී අදහස් වෙනුවට එය විකල්ප අරමුණකින් බලන්නට හැකි මතදාරීන් රටට බිහි කළ යුතුය. එවැනි තීන්දුවකට යාම පහසු නැත. අභියෝගාත්මකය. එනමුත් සමාජයේ පැවැත්ම රඳාපවතින්නේ එවැනි විකල්පයකට මුහුණ දිය හැකිනම් පමණකි. මහජනතාව අත්‍දැකීම් ඇසුරෙන් බුද්ධිමත්වන තරමට පොදු තීන්දු ගැනීමේ අවකාශය පුලුල් වන බව පැහැදිලිය. අප එයට ඉඩ දිය යුතුය. අප සියලු දෙනා මුහුණ දෙන අභියෝගය එයයි.